**මාතර දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 22 - 2023**

**-----------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරන ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22කට අදාළව වාර්තා නිකුත් කර තිබුණු විගණන වාර්තා 22 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 22 විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත විය යුතු සංරචකයන් අතුරෙන් ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 21කට අයත් එකතුව හෙක්ටයාර් 348.8ක් වූ ඉඩම් කැබලි 09ක්, වර්ග අඩි 35,551ක් වූ කාර්යාල ගොඩනැගිලි 11ක්, වර්ග ප්‍රමාණය දක්වා නොමැති කාර්යාල ගොඩනැගිලි 09ක්, වර්ග අඩි 1,559ක් වූ පොහොර ගබඩා 02ක්, වර්ග ප්‍රමාණය දක්වා නොමැති පොහොර ගබඩා 09ක්, වර්ග අඩි 69ක් වූ පැල තවාන් කුටියක්, වර්ග ප්‍රමාණය නොදැක්වූ පැල තවාන් කුටි 03ක්, | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාරක සභාවන්ට අයත් ස්ථාවර වත්කම් සියල්ල ගිණුම් ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ග අඩි 630ක් වූ නිවාසයක්, කාර්යාල පිහිටි ඉඩම් කැබලි යන ස්ථාවර වත්කම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ආ) හක්මණ ගොවිජන සේවා කාරක සභාව විසින් ගිණුම්කරණ පරිගණක මෘදුකාංගයක් මිල දී ගැනීම වෙනුවෙන් රු.248,205ක් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් වෙත ගෙවා එම වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනවන විටත් එම මෘදුකාංගය ගොවිජන සේවා කාරක සභාව වෙත ලැබී නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාරක සභාවන්ට අයත් ස්ථාවර වත්කම් සියල්ල ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) මැදවියන්ගොඩ ගොවිජන සේවා කාරක සභාවෙන් දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යැවිය යුතු සහනාධාර පොහොර අලෙවියෙන් ලද රු.4,875,064ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඈ) අකුරැස්ස ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ ගිණුම පිළියෙල කිරීමේ දී රු.330,500ක්වූ ගැණුම්, ප්‍රවාහන වියදම් ලෙසද රු.339,500ක්වූ විකුණුම් ආරම්භක තොග ලෙසද දක්වා තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඉ) වැලිගම ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ එකතුව රු.122,328ක් වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | සමාලෝචිත වර්ෂයට අයත් ආදායම් හඳුනාගෙන එම වර්ෂයේ දීම ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) රන්සැගොඩ ගොවිජන සේවා කාරක සභාවේ රු.752,070ක් වූ ස්ථාවර වත්කම් නොවන අයිතමයන් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට කාරක සභාව සතුව නොතිබූ රු.171,558ක්වූ වත්කම් විෂයන් 08ක් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව වත්කම්වල ස්වභාවය වර්ග කර ගිණුම්ගත කළ යුතු අතර පොත්වල පවතින නමුත් භෞතිකව නොමැති වත්කම් පිළිබඳව පරීක්ෂාවක් සිදුකර සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |
| (උ) මඩිහ ගොඩගම ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ජංගම ගිණුමේ රු.503,833ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර 2020 ජූලි 31 දිනෙන් පසුව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාරක සභාවට අයත් බැංකු ජංගම ගිණුම් ශේෂ ගිණුම්ගත කළ යුතු අතර මාසිකව බැංකු සැසඳුම් පිළියෙල කළ යුතුය. එලෙස කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 05ක ගිණුම් විෂයයන් 10 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ගිණුම් ශේෂ වටිනාකම හා එයට අදාල අනුරූපී වාර්තා අනුව දක්වා තිබූ වටිනාකම අතර රු.812,611ක නොසැසඳීම් පැවතුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් ශේෂ හා අනුරූපී වාර්තා අතර නොසැසඳීම් සඳහා හේතු හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 02ක එකතුව රු.113,195ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂ 02ක් හා තවත් කාරක සභා 02ක එකතුව රු.51,332ක් වූ අවිනිශ්චිත ගිණුම් බැර ශේෂ 02ක් වසර 10ත් 13ත් අතර කාලයක් තිස්සේ නිරවුල් | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුම් නිරවුල් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

නොකර දිගින් දිගටම ගිණුම් වල පවත්වාගෙන එමින් පැවතුණි.

### 1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 22 කට අයත් වටිනාකම රු.44,731,840ක් වූ ගිණුම් විෂයයන් 147ක් තහවුරු කර ගැනීමට අදාලව අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් හා වගකීම් ශේෂ සනාථ කිරීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) 30(1) (2) (3) (4) හා (5) වගන්ති | යොමුගත වගන්තිය ප්‍රකාරව වගාකළ හැකි සෑම කුඹුරු ඉඩමක්ම වී වගාව සඳහා යෙදවිය යුතු අතර වී වගාකළ නොහැකි අවස්ථාවකදී කොමසාරිස් ජනරාල්ගේ අවසරය ලබා ගැනීමෙන් පසු බහු වාර්ෂික නොවන භෝග හෝ අර්ධ වාර්ෂික භෝග හෝ දීර්ඝකාලීන භෝග වගා කළ හැකිව තිබුණද ගොවිජන සේවා බල ප්‍රදේශ 21ක පවතින පුරන් කුඹුරු අක්කර 10,207ක් වගාකරවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | එකග වෙමි. පුරන් කුඹුරු නිවැරදිව හදුනාගෙන විශ්ලේෂණ වාර්තාවක් සැකසීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 56 (3) (4) | අක්කර බදු ගෙවීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක ඒ බව ලිඛිතව බදුකරුට දැන්වීමක් මගින් දැනුම්දිය යුතු අතර තව දුරටත් ගෙවීම් පැහැර හරින්නේ නම් අධිකරණය වෙත යොමුකර එමගින් අයකර ගැනීමට කටයුතු කළයුතුය. කාරක සභා 15ක සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් අයකර ගැනීමට පැවති රු.2,659,885ක අක්කර බදු මුදල ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තලල්ල, මිරිස්ස හා කිරින්ද යන කාරක සභාවල හිග අක්කර බදු අයකර ඇත. අනෙකුත් සභාවල හිග අක්කර බදු අයකරවීමට ඉදිරියේ දී කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි142 (2) | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා 2022/2023 මහ කන්නයේ වී වගාව සඳහා සහනදායී මුදලට ගොවීන් වෙත අලෙවි කිරීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් වෙත ලබාදී තිබූ පොහොර අලෙවියෙන් ලද රු.6,737,897ක් ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් වෙත නොයවා 2024 අප්‍රේල් මස විගණන අවස්ථාව වනවිටත් කාරක සභා ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | එකග වෙමි. ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් විසින් ඉල්ලා නොමැති නිසා මුදල් යවා නොමැත. එම මුදල් හැකි ඉක්මනින් යැවීමට හෝ ආයෝජනය කිරීමට කටයුතු කරමි | එකතු කරනු ලබන මුදල් කඩිනමින් ප්‍රතිග්‍රාහක නිලධාරියාට යැවිය යුතු අතර මුදල් නිෂ්කාර්යව තබා ගැනීමට කටයුතු නොකළ යුතුය. |
| (ii) | මු.රෙ. 757(2) (අ) (ආ) හා (4) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා | එකග වෙමි. ඉදිරියේ දී විගණනය වෙත එවීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | | |
| (iii) | මුදල් රෙගුලාසි 880, අභ්‍යන්තර ස්වදේශීය කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛය හා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 ජුනි 25 දිනැති අංක 08/2020 දරන චක්‍රලේඛය | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කාරක සභා 22හි ඇප තැබිය යුතු නිලධාරින් 445 දෙනෙකු විසින් ඇප තබා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 ජනවාරි 23 දිනැති අංක 7/2/15/3/3(VII) තාව දරන ලිපිය මගින් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වරුන් නිදහස් කර ඇති බැවින් ඒ අනුව කටයුතු කරන අතර අනෙකුත් නිලධාරීන්ගේ ඇප ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ගොවිජන සංවර්ධන කොමසාරිස් චක්‍රලේඛ** | | | |
| (i) | 2016 සැප්තැම්බර් 08 දිනැති අංක 7/2016 දරන චක්‍රලේඛය | සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ආශ්‍රිත අලෙවිසැලක් ආරම්භ කර පවත්වාගෙන යායුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 04ක් විසින් ඊට අනුකූලව කෘෂි අලෙවිසැලක් ආරම්භ කර කම්ටු ආදායම වර්ධනය කිරීම හා ගොවීන් වෙත අලෙවි සේවාවන් සැපයීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | එම මධ්‍යස්ථානවල අලෙසැල් වෙනම නොමැති නමුත් කෘෂි ද්‍රව්‍ය අලෙවි කටයුතු සිදුකෙරෙන බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභාවක දෛනිකව අතරදවා ගත හැකි මුදල් සීමාව රු.10,000ක් වන නමුත්, කාරක සභා 03ක් විසින් සමාලෝචිත වර්ෂය තුළ දින 33ත් 51ත් අතර දින ගණනක දී දෛනික මුදල් ශේෂය රු.10,471ත් රු.228,227ත් අතර ප්‍රමාණයකින් අතරදවා ගෙන තිබුණි. | එකග වේ. ප්‍රයෝගික අපහසුතා නිසා බැංකු යාමට නොහැකි තත්ත්වයක් පැවති බැවින් මුදල් තැන්පත් කිරීම ප්‍රමාද විය. ඉදිරියේ දී එසේ නොවීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාරක සභා 16ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.10,100,340ක අතිරික්තයක්ද, කාරක සභා 6ක රු.851,542ක ඌනතාවයක්ද විය. ඒ අනුව කාරක සභා 22හි සමස්ථ මූල්‍ය ප්‍රතිඵලය රු.9,248,798ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ කාරක සභා 22 ට අදාල සමස්ථ මූල්‍ය ප්‍රතිඵලය රු.3,396,479 ක අතිරික්තයක් විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 03ක අතිරික්තව පැවති මුදල් ඵලදායීව ආයෝජනය කර වැඩි ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු නොකර එකතු වටිනාකම රු.5,942,134ක් ජංගම ගිණුම් වල රඳවාගෙන තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී ආයෝජනය කිරීමට කටයුතු කරමි. | මුදල් නිශ්කාර්යව තබා නොගෙන විධිමත් අනුමුතිය යටතේ ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා යොදාගත යුතුය. |

### 3.2 හඳුනා නොගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 05ක් විසින් අලෙවි කිරීම සඳහා මිලදීගෙන තිබූ රු.187,260ක් වටිනා ඵලවළු බීජ, කෘෂිරසායනික, පැල හා පොහොර තොග ගොවීන් වෙත අලෙවි කිරීම සඳහා ප්‍රමාණවත් උත්සාහයක් නොගැනීම නිසා ඒවා කල්ඉකුත්වී තිබූ අතර ඒ හේතුවෙන් කමිටුවලට ඉහත වටිනාකමින් පාඩු සිදුවී තිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාරක සභාවට සිදු වූ පාඩු සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. |

### 3.3 දෘශ්‍ය අලාභ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කැකණදුර ගොවිජන සේවා කාරක සභාවේ 2024 අප්‍රේල් 25 දින ගබඩාවේ පැවති තොග පරීක්ෂාව කළ අතර එදිනට තොග පොත් වල පැවති ශේෂ හා භෞතික ශේෂ සැසඳීමේ දී එකතුව රු.70,105ක් වටිනා ERP පොහොර | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොග ඌණතාවයන්ට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

කි.ග්‍රෑම් 1,437.5ක හා යූරියා පෙහොර (සහනාධාර) කි.ග්‍රෑම් 301ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී කාරක සභා 21ක සාමාජිකයින් 93ක් අනුගාමී කාරක සභා රැස්වීම් වාර තුනක් ඉක්මවා සහභාගි නොවූ අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන පනතේ 51(6)(ඇ) (i) හා (ii) වගන්තිය ප්‍රකාරව ඔවුන්ගේ පත්වීම් අවසන් කර ඒ වෙනුවට වෙනත් තැනැත්තන් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී සාමාජිකයින් නැවත පත් කිරීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක7/5/12/11 සහ 2022 ජුනි 01 දිනැති ලිපිය අනුව කටයුතු නොකිරීම නිසා මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 19ක වසර 2 ත් 30 ත් අතර කාල පරාසයක් තුළ නිරවුල් කර නොගෙන පැවති එකතුව රු.10,954,302ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂ 184ක් හා වසර 2 ත් 33 ත් අතර කාල පරාසයක් තුළ නිරවුල් නොකර පැවත එන එකතුව රු. 11,901,592 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂ 140 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන අයවිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් තම රාජකාරි සම්බන්ධයෙන් මාසික ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් ඉදිරිපත් කළ යුතු නමුත්, ගොවිජන සංවර්ධන කාරක සභා 02ක සේවය කරනු ලබන නිලධාරීන් 13ක් විසින් ඉදිරි වැඩසටහන්ද, නිලධාරීන් 17ක් විසින් කළ වැඩ සටහන්ද සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මාසික ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් ඉදිරිපත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රන්සැගොඩ ගොවිජන සේවා කාරක සභාවෙන් විකුණා මුදල් ගෙවීමේ පදනම මත සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් රු.403,300ක් හා දෙසැම්බර් රු.272,500ක් වටිනා කුරුදු පොහොර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයෙකුට කිසිදු නීත්‍යානුකූල ගිවිසුම්ගත වීමකින් තොරව ලබාදී තිබුණු අතර ඉන් රු.562,300ක් 2024 අප්‍රේල් 02 දින වන විටත් පියවීමට කටයුතු නොකර පැවතුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.. | විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂි ද්‍රව්‍ය ලබා දීමේ දී විකුණුම් විටිනාකම් අයකරගැනීම සඳහා කොන්දේසි සහිතව ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතු අතර, අයකර ගැනීමේ කාල ප්‍රමාදය අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වැලිගම ගොවිජන සේවා කාරක සභාවට අයත් පැලතවාන් කුටි 02ක් හා කෞතුකාගාරයක් මෙහෙයුම් කටයුතු වලට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් පූර්ණ ලෙස උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4 ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 22 කට අයත් ගොවි බැංකු 22ක් විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය හා කෘෂි ණයවලින් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ගොවීන් 1,567 කගෙන් අයවිය යුතු එකතුව රු.37,790,966ක ණය ශේෂය කල්පසු වී තිබුණි. එම ණය අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී මට්ටමක පැවතුණි. | එකග වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | බැංකු ණය අදාළ කාලය තුළ අය කරගත යුතු අතර, ව්‍යාපෘති ණය ප්‍රතිලාභ ලබා ගත හැකි වන පරිදි උපයෝජනය කරවීම සඳහා ගොවීන් උනන්දු කරවිය යුතුය. |